# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානයේ පශ්චාත් උපාධි පාඨමාලා සඳහා සිසුන් ලියාපදිංචි කිරීම

## 2022 අධ්‍යයන වර්ෂය

මෙම විශ්වවිද්‍යාලය මගින් පහත දැක්වෙන පශ්චාද් උපාධි පාඨමාලා සඳහා 2021.12.10 දින දක්වා අයදුම්පත් භාරගනු ලැබේ.

### 01. එක් අවුරුදු බෞද්ධ අධ්‍යයන පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (P.G.D.) (SLQF 08-25 Credits)

**අධ්‍යයන මාධ්‍යය** : සිංහල / ඉංග්‍රීසි

**පාඨමාලා ගාස්තුව** : දේශීය සිසුන් සඳහා - රු. 21,750/-
විදේශීය සිසුන් සඳහා - U$$ 405

**ලියාපදිංචිය සඳහා සුදුසුකම්**

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් කවර හෝ විෂය ධාරාවක් යටතේ වසර 03 කට නොඅඩු උපාධි පාඨමාලාවක් සමත්ව තිබීම.

  හෝ

- ප්‍රාචීන අවසාන උපාධිය ලබා තිබීම.

  හෝ

- ඉහත සඳහන් සුදුසුකම්වලට සමාන යැයි විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මගින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් සපුරා තිබීම.

### 02. එක් අවුරුදු ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (M.A.) (SLQF 09-30 Credits)

**අධ්‍යයන මාධ්‍යය** : සිංහල / ඉංග්‍රීසි

**අධ්‍යයන විෂය ධාරාව** : බෞද්ධ අධ්‍යයන / සිංහල / පාලි / සංස්කෘත / ඉංග්‍රීසි

**පාඨමාලා ගාස්තුව** : දේශීය සිසුන් සඳහා - රු. 37,500/-
විදේශීය සිසුන් සඳහා - U$$ 555

**ලියාපදිංචිය සඳහා සුදුසුකම්**

ඉහත අංක 01 යටතේ වන සුදුසුකම්

### 03. ශාස්ත්‍රපති (දෑවුරුදු) පර්යේෂණ උපාධි පාඨමාලාව (M.A.) (SLQF 10-60 Credits)

**අධ්‍යයන මාධ්‍යය** : සිංහල / ඉංග්‍රීසි

**අධ්‍යයන විෂය ධාරාව** : බෞද්ධ අධ්‍යයන / සිංහල / පාලි / සංස්කෘත / ඉංග්‍රීසි

**පාඨමාලා ගාස්තුව** : දේශීය සිසුන් සඳහා - රු. 57,500/-
විදේශීය සිසුන් සඳහා - U$$ 705

**ලියාපදිංචිය සඳහා සුදුසුකම්**

ඉහත අංක 01 යටතේ වන සුදුසුකම්

හෝ

පිළිගත් විශ්වවිද්‍යාලයක එක් අවුරුදු ශාස්ත්‍රපති උපාධිය සමත් වීම.

### 04. දර්ශනපති උපාධි පාඨමාලාව (M.Phil.) (වසර දෙකකි) (SLQF 11)

**විෂය ධාරාව** : බෞද්ධ දර්ශනය / බෞද්ධ සංස්කෘතිය / බෞද්ධ ශිෂ්ටාචාරය / බෞද්ධ අධ්‍යයනය / සිංහල / පාලි / සංස්කෘත / පුරාවිද්‍යාව / සමය අධ්‍යයනය හා තුලනාත්මක දර්ශනය / ඉංග්‍රීසි

**අධ්‍යයන මාධ්‍යය** : සිංහල / ඉංග්‍රීසි

**පාඨමාලා ගාස්තුව** : දේශීය සිසුන් සඳහා - රු. 64,000/-
විදේශීය සිසුන් සඳහා - U$$ 1305

**ලියාපදිංචිය සඳහා සුදුසුකම්**

- ඉහත විෂය ධාරාවන්ට අදාළ ව ප්‍රථම පන්ති / දෙවන පෙළ ඉහළ පන්ති සාමර්ථ්‍යයක් සහිතව ශාස්ත්‍රවේදී **(විශේෂ)** උපාධියක් ලබා තිබීම.

  හෝ

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉහත විෂය ධාරාවන්ට අදාළව ශාස්ත්‍රපති එක් අවුරුදු උපාධි පාඨමාලාවකින් සමත් වීම.

  හෝ

- වෙනත් ඕනෑම විෂය ධාරාවකින් ප්‍රථම පන්ති / දෙවන පෙළ ඉහළ පන්ති සාමර්ථ්‍යයක් සහිත ව ශාස්ත්‍රවේදී **(විශේෂ)** උපාධියක් හෝ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇති අපේක්ෂකයෙකු ඉහත විෂය ධාරාවන්ට අදාළව පශ්චාද් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම. (එහිදී පශ්චාද් උපාධි ඩිප්ලෝමාවට අදාළ විෂය ධාරාවෙන් දර්ශනපති උපාධිය සඳහා ලියාපදිංචි විය හැකිය)

  හෝ

- ඉහත සඳහන් සුදුසුකම්වලට සමාන යැයි විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මගින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් සපුරා තිබීම.

### 05. ආචාර්ය උපාධි පාඨමාලාව (Ph.D.) (වසර තුනකි) (SLQF 12)

**විෂය ධාරාව** : බෞද්ධ දර්ශනය / බෞද්ධ සංස්කෘතිය / බෞද්ධ ශිෂ්ටාචාරය / බෞද්ධ අධ්‍යයනය / සිංහල / පාලි / සංස්කෘත / පුරාවිද්‍යාව / සමය අධ්‍යයනය හා තුලනාත්මක දර්ශනය / ඉංග්‍රීසි

**අධ්‍යයන මාධ්‍යය** : සිංහල / ඉංග්‍රීසි

**පාඨමාලා ගාස්තුව** : දේශීය සිසුන් සඳහා - රු. 79,000/-
විදේශීය සිසුන් සඳහා - U$$ 1755

**ලියාපදිංචිය සඳහා සුදුසුකම්**

- ඉහත විෂය ධාරාවන්ට අදාළව පිළිගත් විශ්වවිද්‍යාලයකින් වසර දෙකකට නොඅඩු පර්යේෂණ පශ්චාද් උපාධියක් ලබා තිබීම / සාමාජීය විද්‍යාපති උපාධියක් (MSSc) / දර්ශනපති උපාධියක් (M.Phil.) ලබා තිබීම.

  හෝ

- ඉහත සඳහන් සුදුසුකම්වලට සමාන යැයි විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මගින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් සපුරා තිබීම.

**අයදුම් කළ යුතු පිළිවෙල :**

**අයදුම්පත් ගාස්තුව :**

බෞද්ධ අධ්‍යයන පශ්චාද් උපාධි ඩිප්ලෝමා / ශාස්ත්‍රපති උපාධි (එක් අවුරුදු / දෑවුරුදු) - රු. 1,000/-

දර්ශනපති / ආචාර්ය උපාධි පාඨමාලා - රු. 1,000/-

අයදුම්පත් හා විස්තර පත්‍රිකා ලබා ගැනීම සඳහා දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකින්, ගිණුම් අංක 711202 ට '**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය**' නමින් අදාළ අයදුම්පත්‍ර ගාස්තුව ගෙවා ලබා ගන්නා ලදුපත විශ්වවිද්‍යාලයේ පහත සඳහන් ලිපිනයේ පිහිටි කාර්යාලය වෙත පැමිණ ඉදිරිපත් කිරීමෙන් හෝ ලියාපදිංචි තැපැල් මගින් එවීමෙන් අයදුම්පත් හා විස්තර පත්‍රිකා ලබාගත හැකිය. තැපැල් මගින් අයදුම්පත් හා විස්තර පත්‍රිකා ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම් ඉහත ගිණුම් අංකයට අයදුම්පත්‍ර ගාස්තුව ගෙවා ලබා ගන්නා ලදුපත සමග තම නම, ලිපිනය ලියන ලද 9" X 4" ප්‍රමාණයේ රු. 45/- ක මුද්දර ඇලවූ කවරයක් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.

එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ පාඨමාලාවේ නම සඳහන් කර, '**අයදුම්පත්‍ර ලබා ගැනීම**' යනුවෙන් සඳහන් කළ යුතුය. චෙක්පත් හෝ තැපැල් ඇණවුම් භාර ගනු නොලැබේ.

**නියෝජ්‍ය ලේඛකාධිකාරී,**
**පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය,**
**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,**
**අංක 214, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.**

අයදුම්පත්‍ර ගාස්තුව ගෙවීමේ දී අදාළ පාඨමාලාවේ කෙටි නාමය සඳහන් කළ යුතුය.

(P.G.D./M.A./M.Phil./Ph.D.)

අන්තර්ජාලයේ www.bpu.ac.lk දරන විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් ද අයදුම්පත් ලබාගත හැකිය. එසේ ලබා ගන්නා අයදුම්පත් විශ්වවිද්‍යාලයට භාරදීමේ දී දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකින්, ඉහත ගිණුම් අංකයට අයදුම්පත්‍ර ගාස්තුව ගෙවා ලබා ගන්නා ලදුපත සමග ඉදිරිපත් කළ යුතුය.

**සැලකිය යුතුයි** : ශාස්ත්‍රපති (එක් අවුරුදු / දෑවුරුදු) උපාධි පාඨමාලාව සඳහා ඉංග්‍රීසි විෂය ධාරාවෙන් පෙනී සිටීමට අපේක්ෂා කරන්නේ නම්, ශාස්ත්‍රවේදී (ගෞරව / සාමාන්‍ය) උපාධිය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයක් වශයෙන් හදාරා තිබීම අනිවාර්යය වේ.

හෝ

ඉංග්‍රීසි භාෂාව / සාහිත්‍යය / ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත විශ්වවිද්‍යාලයකින් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

සහ

එම අපේක්ෂකයන් ඉංග්‍රීසි අධ්‍යයනාංශය මගින් පවත්වනු ලබන තෝරාගැනීමේ ලිඛිත පරීක්ෂණයට පෙනී සිට ඉන් සමත් වීම හා සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටිය යුතුය.

**අයදුම්පත් නිකුත් කරන අවසාන දිනය**

- පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ ශාස්ත්‍රපති (එක් අවුරුදු / දෑවුරුදු) පාඨමාලා සඳහා 2021.12.07 දින දක්වා පමණක් අයදුම්පත් නිකුත් කරනු ලැබේ.
- දර්ශනපති හා ආචාර්ය උපාධි පාඨමාලා සඳහා වසරේ ඕනෑම දිනක දී අයදුම්පත් ලබා ගත හැකිය.

නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2021.12.10 දිනට පෙර ඉහත ලිපිනයට යොමු කළ යුතුය.

**වැඩි විස්තර සඳහා : 0112580609**

**ලේඛකාධිකාරී,**
**පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය,**
**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,**
**නො. 214, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.** **2021.10.04**